බලංගොඩ නගර සභාව - 2020
---------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

බලංගොඩ නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) පනතේ 6 (i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ මුද්දර ගාස්තු රු.9,882,204 ක් වෙනත් ආදායම් වලට බැර කර තිබීම හේතුවෙන් වර්ෂයේ මෙහෙයුම් ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | සමුච්චිත අරමුදලට බැරවිය යුතු වටිනාකම අතපසුවීමකින් වෙනත් ආදායම් ගිණුමට බැර කර ඇත. ඉදිරියේදී මෙවැනි අතපසුවීම් වළක්වා ගැනීමට කටයුතු කරන බව. | ඉකුත් වර්ෂයට අදාළ ආදායම සමුච්චිත අරමුදලට බැර කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ ජංගම නොවන වත්කම් මිලදී ගැනීම් හා වැඩි දියුණු කිරීම් එකතුව රු.28,058,385 ක් වුවද, එය රු.29,353,432 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.1,295,047 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී මෙම දෝෂය නිවැරදි කිරීමට අපේක්ෂා කරන බව. | වැඩිපුර ප්‍රාග්ධනිත කර ඇති වටිනාකම අදාළ වත්කම් ගිණුමෙන් ඉවත් කළ යුතුවේ. |
| (ඇ) | ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොළී රු.240,646 ක් උපලබ්ධිවීමට පෙර තැන්පතු ගිණුමට හර කර තිබීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත් ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණු අතර ජංගම වත්කම් සමාන වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව. | ස්ථාවර තැන්පතු පොළිය උපලබ්ධි වූ පසු තැන්පතු ගිණුමට හර කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මුදල් මාරු ගිණුමේ රු.9,307,943 ක ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී මෙම ශේෂයෙන් සැලකිය යුතු මුදලක් නිරවුල් කිරීමට අපේක්ෂා කරන බව. | මුදල් මාරු ගිණුමේ ශේෂය හඳුනාගෙන නිරවුල් කළ යුතුවේ. |
| (ඉ) | ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා වැය කරන ලද රු.41,078 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.104,817 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ගැලපුම් කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.23,422,086 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,604,413 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් රු.19,999,221 ක් වැඩිවී තිබීම එම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් රු.4,273,339 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණු අතර, ඊට අදාළ කාල විශ්ලේෂණයක් ද සකස් කර නොතිබුණි. | 2019 වර්ෂයේ සිදු වූ පාස්කු ප්‍රහාරය හා 2020 වර්ෂයේ දී ඇති වූ කොරෝනා වසංගතය හේතුවෙන් වරිපනම් බදු අයකර ගැනීමේ ප්‍රතිශතය අඩුවී ඇති අතර, පරිගණක වැඩසටහන වැඩිදියුණු කර කාල විශ්ලේෂණය සකස් කිරීමට ඉදිරියේදී සැලසුම් කර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

(ආ) **කුලී**

-----

| | | |
|---|---|---|
| එකතුව වර්ග මීටර් 38.43 ක් වූ ඉම්පීරියල් ඉදිරිපිට කඩකාමර 14 ක් සඳහා මාස 06 ක සිට මාස 29 දක්වා කාල සීමාවක් අයනොවී පැවතුණු හිඟ කුලී රු.199,250 ක් 2021 අප්‍රේල් වන විටත් අයකර ගෙන නොතිබුණි. එම කඩ කාමරවල බදු කුලිය වර්ෂ 05 කට වරක් සංශෝධනය කිරීමට සභාව කටයුතු කර නොතිබුණු අතර, ඒවා පවත්වාගෙන යන පුද්ගලයන් 14 දෙනා සමඟ ලිඛිතව ගිවිසුම්ගත වීමට ද කටයුතු කර නොතිබුණි. | ඒවා පවත්වා ගෙනයන අය විසින් සුළු ඉඩ ප්‍රමාණයක තාවකාලිකව ඉදිකර ගන්නා ලද කුඩා කඩකාමර බැවින්, නගර සභාව විසින් එම කඩකාමර වලින් පදික වෙළෙන්දන්ගෙන් අයකරන ගාස්තු පදනම් කරගෙන මාසික කුලියක් අය කරනු ලබයි. තවද, එම කඩකාමර වල අයිතිය තහවුරු කිරීමට සභාවට නොහැකි වීම නිසා ලිඛිත ගිවිසුමකට එළඹීමට නොහැකි වූ බව. | ලිඛිත ගිවිසුම් වලට එළඹීමට හා හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

(ඇ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

| | | |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.445,326 ක් 2021 මාර්තු වන විටත් අයකර ගෙන නොතිබූ අතර, 2020 මැයි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළව අයවිය යුතු මුද්දර ගාස්තු 2021 මාර්තු වනවිටත් හඳුනාගෙන නොතිබුණි. | උසාවි දඩ මුදල් පළාත් සභාවෙන් ලැබී නොමැති අතර, ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 වර්ෂයට පෙර සිට ඉදිරියට එන විවිධ අත්තිකාරම් ගිණුමේ පවතින රු.8,680,970 ක හඳුනා නොගත් ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | විවිධ අත්තිකාරම් ගිණුමේ තව දුරටත් පවතින ශේෂය අඩුකර ගැනීමට කටයුතු කරන බව. | අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සභාව සතු රජයේ නිවාස 05 ක් සඳහා ආර්ථික කුලිය අයකරමින් පැවති අතර එකී ආර්ථික කුලිය 2010 | සභාවේ නිල නිවාස තක්සේරු කර, තක්සේරු වටිනාකම් නියම කර | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිවාස කුලිය අය |

| | | |
|---|---|---|
| වර්ෂයෙන් පසු නැවත තක්සේරු කර නොතිබුණි. 2010 වර්ෂයේදී සිදුකර තිබූ තක්සේරුවේදී මසකට රු.2,000 ක ආර්ථික කුලියක් අයකළ යුතු බව දක්වා තිබූ රජයේ නිවසක් සඳහා 2013 දෙසැම්බර් දක්වා මාසිකව රු.1,000 ක් පමණක් අයකර තිබූ අතර 2014 ජනවාරි සිට රු.1,500 ක් පමණක් අයකරමින් පැවතුණි. එම හේතුවෙන් සභාවට අහිමි වී තිබූ කුලී ආදායම රු.78,000 ක් විය. | තිබුණ ද 2013-11-30 දින සභා තීරණයට අනුව රු.1500ක මාසික කුලියක් අය කිරීමට තීරණය කර ඇති බැවින් එම තීරණය මත කුලිය අය කිරීමට කටයුතු කර ඇති බව. | කළ යුතුවේ. |